වෘත්තීය සමිති එකමුතුව

දිස්ත්‍රික් මහ රෝහල

ඇඹිලිපිටිය

2025/03/12

වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය

සෞඛ්‍ය අමාත්‍යාංශය

කොළඹ

**ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරයාගේ අත්තනෝමතික ක්‍රියාකලාපය පිළිබඳව**

**ගරු අමාත්‍යතුමනි,**

ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්ෂ ලෙස 2024/12/02 දින සිට රාජකාරි සිදු කරන වෛද්‍ය දිලීප් එච්. ලියනගේ මහතාගේ අදූරදර්ශී අත්තනෝමතික, මූල්‍ය විරෝධී සහ සදාචාරාත්මක නොවන ක්‍රියාකලාපය නිසා රෝගීන්, ප්‍රෙද්ශයේ සහ ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ සියලුම කාර්යමණ්ඩලය විශාල අපහසුතාවයකට පත්ව ඇත. ඔහු විසින් සිදු කරමින් යන අත්තනෝමතික සහ මූල්‍ය විශමාචාර ගණනාවක් වංචා කිහිපයක් පිලිබඳව සැකවින් ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කරන්නෙමු.

11. රාජ්‍ය මුදල් රුපියල් මිලියන 5ක් වැයකර නවීකරණය කරන ලද ආයතන අංශ ගොඩනැගිල්ල එම නිලධාරීන් එහි සේවය ආරම්භ කර සතියක් යාමට මත්තෙන් බලහත්කාරයෙන් එලවා දමා තම කාර්යාලය සඳහා එම මුළු අංශයම යොදා ගැනීම. එම ඉදිකිරීමට අදාල රඳවා තබාගැනීමේ මුදල් (Retention) කොන්ත්‍රාත් කරුට ගෙවීමටත් පෙර එහි සවිකර තිබූ බිත්ති අල්මාරි අත්තනෝමතික ලෙස කඩා ඉවත් කිරීම. කාර්යමණ්ඩල මේස සඳහා සවිකරන ලද විදුලි සැපයුම් සහ පේනු ගලවා දැමීම. ආර්තිකව ප්‍රපාතයකට වැටී රෝගීන්ට අත්‍යාවශ්‍ය ඖෂධ පවා මිලදී ගැනීමට පවා මුදල් නොමැති පසුබිමක සෞඛ්‍ය අමාත්‍යංශ මුදල් උමතුවෙන් මෙන් කාබාසිනියා කිරීම.
12. නොමේරු ළදරු ඒකකය වායුසමීකරණය කිරීමේ ප්‍රසම්පාතනයට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අත්තනෝමතික ලෙස බැහැර කර තමාට රිසි පරිදි අඩු වායුසමීකරණ යන්ත්‍ර ප්‍රමානයක් පමනක් එහි සවිකර අනෙක් ඒවා තම හිතුමතයට තැන් තැන්වල සවි කිරිම. මෙහිදී මොහු තාක්ෂණික ඇගයීම් කමිටුවේ සිටි ඉංජිනේරු වරයාගේ නිර්දේශ පවා බැහැර කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමු අමුවේ උල්ලංඝනය කර ඇත. මෙම සියළු කටයුතු නිලධාරීන්ට බලපෑම් සහ තර්ජනය කරමින් බලහත්කාරයෙන් සිදු කර ඇත.
13. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩමක ඉදිකර ඇති රෝහලේ වෛද්‍ය නිල නිවාස ලෙස තාවකාලික පරිහරණයට ලබාදී තිබූ ගොඩනැගිල්ල එම අධිකාරියේ නිසි අවසරයකින් තොරව කඩා බිඳ දමා වෙනස් කිරීම. සෞඛ්‍ය බලධාරීන් නොමග යවා සෞඛ්‍ය අමාත්‍යංශ මුදල් නිසි අවසරයකින් තොරව මහවැලි අධිකාරිය සතු ගොඩනැගිල්ලක් වෙනස් කිරීමට සහ එම පරිශ්‍රයේ තාප්පයක් ඇතුළු නව ඉදි කිරීම් සිදු කිරීම. පෙර සිටි අධ්‍යක්ෂවරයා ඔහු නික්ම යාමට ඉතා කෙටි කලකට පෙර සිදුකල ඉදිකිරීම් රාජ්‍ය මුදල් යොදවා නැවත වෙනස්

CamScanner

කිරීම. තමන්ට රිසි පාටින් නැවත තීන්ත ආලේප කිරීම. රෝහලේ වායුසමීකරණ යන්ත්‍ර ගලවාගෙන ගොස් එහි සවි කිරීම.

14. රුපියල් ලක්ෂ 27ක් වියදම් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරමින් තමාගේ කැබ් රථයේ පහසුකම් වැඩි දියුණු කිරීම. ඒ සඳහා වන ප්‍රසම්පාදන අනුමැතිය ලැබීමටත් පෙර Purchasing Order ලිපිය නිකුත් කිරීම. රෝහලේ භාහිර සායන සඳහා යාමට වෛද්‍යවරුන්ට ලබාදී ඇති අබලන් වී දිරාපත් වී ඇති වෑන් රථය අළුත්වැඩියා කලේ නම් එය වඩා ප්‍රයෝජනවත් වනු ඇත. තත්ත්වය එසේ තිබියදී මහජන මුදල් කාබාසිනියා කරමින් උමතු ලෙස හැසිරීම.

15. මෙලෙස සිදු කරනු ලබන බරපතල මූල්‍ය විෂමාචාර වලට විරුද්ධව හඬ නැගූ සහ ඒ පිලිබඳ විස්තර අභ්‍යන්තර විගණන අංශයට හෙලි කරනු ලැබූ නිර්භීත ගිණුම් අංශයේ ප්‍රසම්පාදන නිළධාරීන්ගෙන් පලිගැනීම සඳහා අභ්‍යන්තර ස්ථාන මාරු මුවාවෙන් ඔවුන් මාරු කිරීමට බලපෑම් කිරීම.

16. රටේ ජනාධිපති සහ මැති ඇමතිවරුන් පවා පහසුකම් අත් හරින යුගයක, තම් පෞද්ගලික සුඛ විහරණය සඳහා රජයේ මුදලින් නීතියට පටහැනිව නිල නිවාසය සඳහා භාණ්ඩ මිලදී ගැනීම. රෝහල් අධ්‍යක්ෂ නිල නිවාස සඳහා රජයේ වියදමින් භාණ්ඩ සැපයීමට කිසිදු නීතිමය ප්‍රතිපාදනයක් නොමැති වුවත් මොහු ගිණුම් අංශයේ නිලධාරීන්ට තර්ජනය කර බලහත්කාරයෙන් ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව නිල නිවාසය සඳහා පහත සඳහන් භාණ්ඩ මිලදීගෙන ඇත. (පිඟන්, පීරිසි කෝප්ප, කරි දීසි, ගෑස් කුකර්, රයිස් කුකර්, ප්‍රෙෂර් කුකර්, ෆ්‍රිජ්, ග්‍රයින්ඩර්, සැප පහසු ඉතා මිල අධික සුපිරි ඇඳ මෙට්ට). මෙම වංචාව වසන් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශ නිලධාරීන් නොමග යවා අනුමැති ලිපි සකස් කර ගැනීම. අදාල ආයතනයන්ට බලපෑම් කර නව බිල් ලබා ගෙන ප්‍රම්පාදන ගොණුව නැවත සැකසීම. මෙම අයථා ක්‍රියාවන් සිදු කිරීමට නිලධාරීන් බිය වැද්දීම සහ තර්ජනය කිරීම.

17. රෝහලේ සැපයුම් කරුවන්ට බිල් නොගෙවන බවට තර්ජනය කරමින් රුපියල් ලක්ෂ ගනන් වටිනා සුව පහසු විධායක පුටු, මේස ඔවුන් ලවා පරිත්‍යාග මුවාවෙන් ලබා ගැනීම.

18. රෝහල් ආරක්ෂක අංශය, පිරිසිදු කිරීමේ සේවකයන් නිල නිවාසයේ වැඩට යොදා ගැනීම. ඔවුන්ට තිරිසනුන්ට මෙන් සලකමින් ඔහු හා ඔහුගේ බිරිඳ එක්වී ඔවුන් වහල් සේවයට යොදා ගැනීම. උදාහරණ ලෙස අධ්‍යක්ෂකගේ සුනඛයා නෑවීම පවා සිදු කරවා ගැනීම. එම සේවකයන් පිලියෙල කරන ආහාර ඔවුන්ට ලබා නොදී රෝහල් මුළුතැන්ගෙයින් තුන් වේල සඳහාම ආහාර සැපයීම. ඔහුගේ පාද සම්භාහනයට පවා ආරක්ෂක අංශයට බලපෑම් කිරීම. එසේ කිරීම ප්‍රතික්ෂේප කරන සේවකයන් නිල නිවාසයෙන් ඉවත් කර, රහස් හෙලිවීම වැලැක්වීම සඳහා නැවත ඔවුන් රෝහලේ සේවයට නොයොදා අදාල සමාගමෙන් ඉවත් කරවීම හා එලෙස කිරීමට බලපෑම් කිරීම.

19. රෝහලේ කාර්‍යාල කාර්යමණ්ඩලයට සුභ සාධක සංගමයක් ආරම්භ කරන ලෙස බලපෑම් කිරීම. ඒ මගින් විවිධ ආයතන සහ පුද්ගලයන්ගෙන් එහි ගිණුමට මුදල් රැස් කිරීමට බල කිරීම. එසේ ආරම්භ නොකිරීම පිළිබඳ කාර්‍යාල කාර්‍යමණ්ඩලයට ප්‍රසිද්ධ රැස්වීම් වල බැන වැදීම.

20. රජයේ නිල නිවාසයන්හි සතුන් ගොවිපොල පවත්වාගෙන යාම. කුකුළු කූඩු, වටු කුරුලු කූඩු, කුඹුරු වගාවන්, එලවලු වගාවන් සිදු කිරීම. මේවාට ජලය යෙදීමට රජයේ විදුලිය යොදාගෙන නල ජලය පොම්ප කිරීම. වගා කිරීම සහ සතුන් බලා ගැනීමට රෝහලේ ආරක්ශක අංශය සහ පිරිසිදු කිරීමේ සේවා සපයන සේවකයන් යොදා ගැනීම. ඔවුන්

CS CamScanner

සේවයට ලබා ගැනීම සඳහා ආරක්ශක සේවා සපයන ආයතනය සහ පිරිසිදු කිරීමේ සේවා සපයන ආයතනයේ බිල් නොගෙවවන බවට තර්ජනය කිරීම.

**ගරු අමාත්‍යතුමනි,** ඉහත දක්වා ඇත්තේ ඔහුගේ අත්තනෝමතික මූල්‍ය විෂමාචාර ක්‍රියාවන් වලින් කිහිපයක් පමණි. දූෂණයෙන් තොර ලස්සන රටක් පොහොසත් ජීවිතයක් යන සංකල්පය යථාර්ථයක් කිරීමට මෙවන් දූෂිත පරිපාලන රාජ්‍ය නිලධාරීන් දැඩි බාධාවකි. එබැවින් සමස්ත රෝහල් කාර්ය මණ්ඩලය ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනුයේ,

02. රෝහල් අධ්‍යක්ෂක වෛද්‍ය දිලිප් එච්.ලියනගේ මහතා වහාම එම තනතුරෙන් ඉවත් කර ඔහු විසින් සිදු කර ඇති බරපතල මූල්‍ය විෂමාචාර පිලිබඳ නිසි පරීක්ෂණයක් ආරම්භ කිරීම.

ඉහත ඉල්ලීම ඉෂ්ට වන තුරු 2025.03.12 දින මධ්‍යහන 12.00 සිට සියලුම රෝහල් කාර්‍යමණ්ඩලය විසින් ආරම්භ කරනු ලැබූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග දැඩි කරමින් තව දුරටත් ඉදිරියට සිදු කර යන බව කණගාටුවෙන් යුතුව දැනුම් දෙන්නෙමු.

ස්තූතියි

**Dr. Nuwan Wickrama Kaluthota**
**Dr. Priyankara Gamage**
Secretary
GMOA Branch Union
Embilipitiya

සමස්ථ ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

රජයේ හෙද නිළධාරීන්ගේ සංගමය

සමස්ත ලංකා හෙද සංගමය

සමස්ත ලංකා වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ සංගමය

සමස්ත ලංකා ඖෂධවේදීන්ගේ සංගමය

සමස්ත ලංකා පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණී සංගමය

රජයේ විද්‍යුත් ඛන්තුරේඛන ශිල්පී සංගමය

රජයේ විකිරණ විද්‍යා තාක්ෂණවේදීන්ගේ සංගමය

ජනරජ සෞඛ්‍ය සේවා සංගමය

ප්‍රගතිශීලී සෞඛ්‍ය සේවා සංගමය

**ලේකම්**
**එච්,ආර්,එස්, රණතුංග**
**ප්‍රගතිශීලී සෞඛ්‍ය සේවා සංගමය**
**දිස්ත්‍රික් මහ රෝහල**
**ඇඹිලිපිටිය.**

01. ගරු නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය තුමන් - කා.දැ.ගැ සහ අ.ක.ස.

02. ජනාධිපති ලේකම් තුමන් - කා.දැ.ගැ සහ අ.ක.ස.

03. ලේකම් (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යංශය) - කා.දැ.ගැ සහ අ.ක.ස.

04. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ගැ සහ අ.ක.ස.

CS CamScanner